# (ඇ) රැකීරක්ෂා සහ කම්කරු සම්බන්ධතා

## රැකී රක්ෂා

තුන් අවුරුදු ක්‍රියාකාරී කෙටුම්පත් වැඩ පිළිවෙළට අනුව කම්කරු දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් ලංකාවේ රක්ෂා ඇතියවුන්, නැතියවුන් හා අර්ධ වශයෙන් රැකියා ඇතියවුන් පිළිබඳ පරීක්ෂණයක් 1959 දී කරන ලදී. මේ පරීක්ෂණයට අනුව 1959 දී රක්ෂා නැතියවුන්, 3,75,000ක් සිටිය බව හෙළිවිය. මේ හැර, ගැමි කම්කරුවන්ගෙන් සියයට 35 කට සහ නාගරික කම්කරුවන්ගෙන් සියයට 20 කට අවුරුද්දේ සමහර කාලවලදී රැකී රක්ෂා නැතිවෙයි. නැතහොත් වැඩ ලැබෙනුයේ විටින් විටය.*

ලංකාවේ රක්ෂා – විරක්ෂා තත්ත්වය පිළිබඳ වාර්ෂික තොරතුරු ලබාගත හැක්කේ නොවේ. වාර්ෂිකව සංඛ්‍යා තොරතුරු නොමැති නිසා විරක්ෂා තත්ත්වයෙහි වාර්ෂිකව ඇතිවන වෙනස් කම් දළ වශයෙන් දැනගත හැක්කේ රැකී රක්ෂා කාර්යාල වල ලියාපදිංචි වී ඇති අයගේ සංඛ්‍යා වලිනි. 1961 අවසානයේදී රැකී රක්ෂා කාර්යාල වල ලියාපදිංචි වී සිටිය ගණන පසුගිය වස රේදීට වඩා සියයට 0.1 කින් වැඩිය. නැවත මේ ගණන 1962 දී තරමක් වැඩිවිය. මේ අනුව 1961 ලියාපදිංචි වූ ගණන 1,51,265 ක් වූ අතර, 1962 නොවැම්බර් මාසය වන විට එය 1,52,209 තෙක් වැඩිවිය. රැකී රක්ෂා කාර්යාලවල ලියාපදිංචි ගණන අඩුවෙන්ම පැවැතියේ 1962 දෙවැනි කාර්තුවේදීය. කාර්මික හා ලිපිකරු වෘත්තීන් සඳහා ලියාපදිංචි ප්‍රමාණය අවුරුද්ද තුළ සැලකිය යුතු ලෙස වැඩි වූයේ අවුරුද්ද අවසාන වන විට මේ අය 1961 දෙසැම්බර් මාසයේ සිටිය ප්‍රමාණ යට වඩා සියයට 22·4 කින් වැඩිවිය. පුහුණු හා අර්ධ පුහුණු අයගේ ගණන සාමාන්‍යයෙන් නොවෙනස්ව මෙන් පැවැතිණි. එහෙත් නුපුහුණු කම්කරුවන්ගේ ගණන අවුරුද්ද තුළ කෙමෙන් අඩු වූයේ පසුගිය අවුරුද්දේදීට වඩා සියයට 8·1 කින් අඩුවිය.

මෑත වර්ෂවලදී රැකී රක්ෂා ලබා දුන් අයගේ ගණනද පොත්වල ඒ ඒ වර්ගයෙන් ලියාපදිංචි වී ඇති මුළු ගණනට, එහි ඇති සියයට ගණන්ද පහත සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II ඇ—1

**රැකියා ලබාදුන් සංඛ්‍යාව හා ඒ ඒ වර්ගයෙන් ලියාපදිංචි වී ඇති සංඛ්‍යාවට එහි ඇති සියයට ගණන**

| වර්ෂය | කාර්මික හා ලිපිකරු | % | පුහුණු | % | අර්ධ පුහුණු | % | නුපුහුණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1953 .. | 1,528 | 18·2 | 669 | 10·4 | 1,371 | 10·0 | 2,820 | 12·2 | 6,388 | 12·4 |
| 1954 .. | 1,097 | 9·4 | 879 | 11·1 | 922 | 5·7 | 4,660 | 17·0 | 7,558 | 11·9 |
| 1955 .. | 2,166 | 14·9 | 1,064 | 12·5 | 1,187 | 5·9 | 3,791 | 13·6 | 8,208 | 11·6 |
| 1956 .. | 1,913 | 11·9 | 845 | 8·6 | 1,565 | 6·1 | 4,162 | 12·1 | 8,485 | 9·9 |
| 1957 .. | 1,176 | 6·3 | 709 | 5·3 | 1,180 | 3·8 | 3,053 | 6·4 | 6,118 | 5·5 |
| 1958 .. | 1,827 | 9·2 | 800 | 5·9 | 1,006 | 3·1 | 2,251 | 4·4 | 5,884 | 5·0 |
| 1959 .. | 1,667 | 8·0 | 1,045 | 7·5 | 1,275 | 3·8 | 3,218 | 5·4 | 7,205 | 5·6 |
| 1960 .. | 1,400 | 5·3 | 771 | 4·6 | 1,247 | 3·6 | 4,744 | 6·5 | 8,162 | 5·4 |
| 1961 .. | 1,259 | 4·6 | 631 | 3·5 | 964 | 2·8 | 2,794 | 3·9 | 5,648 | 3·7 |
| 1962* .. | 1,263* | 3·7 | 498* | 2·9 | 808* | 2·3 | 2,315* | 3·5 | 4,855* | 3·2 |

*තාවකාලිකයි

සංඛ්‍යා—කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

රැකියා ලබා දුන් ගණන පසුගිය අවුරුදු වලට වඩා අඩුවී ඇත. වැඩි වශයෙන්ම රැකියා ලබා දී ඇත්තේ නුපුහුණු කම්කරුවනටය. ඒ ඒ වර්ගය යටතේ ලියාපදිංචි වී ඇති අයගෙන් වැඩි ප්‍රමාණයක් රැකියා ලබාදී ඇත්තේ කාර්මික හා ලිපිකරු වර්ගයේ අයටය. මෙය මේ වර්ගයේ මුළු ගණනින් සියයට 3·7 ක් විය. නුපුහුණු කම්කරුවෝ දෙවැනි තැනට වැටෙත්.

* තුන් අවුරුදු ක්‍රියාකාරී කෙටුම්පත් වැඩ පිළිවෙළ 1962/89 වැනි පිට.

**කම්කරු සම්බන්ධතා**

වැඩ වර්ජන පිළිබඳ සංඛ්‍යා තොරතුරු වලින් සේව්‍ය–සේවක සම්බන්ධතා එක්තරා ප්‍රමාණයකින් පිළිබිඹු වෙයි. වැඩ වර්ජන ගණන, වර්ජනයට හවුල් වූ සේවකයන් ගණන සහ ඉන් නැති වූ මිනිස් දවස් ගණන පහත එන සංඛ්‍යා සටහනේ දැක්වේ.

සංඛ්‍යා සටහන II ඈ—2

**වැඩ වර්ජන**

| වර්ෂය | වැවිලි | | | වෙනත් රැකියාවන් | | |
|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන ගණන | සම්බන්ධ වූ කම්කරුවන් | නැතිවූ මිනිස් දවස් | වැඩ වර්ජන ගණන | සම්බන්ධවූ කම්කරුවන් | නැතිවූ මිනිස් දවස් |
| 1958 .. | 123 | 39,372 | 3,40,632 | 96 | 42,713 | 3,99,228 |
| 1959 .. | 177 | 47,318 | 3,52,095 | 71 | 42,453 | 4,60,141 |
| 1960 .. | 123 | 42,528 | 2,59,948 | 37 | 4,839 | 15,139½ |
| 1961 .. | 90 | 29,223 | 3,17,866 | 39 | 38,013 | 1,70,372 |
| 1962* .. | 130 | 39,658 | 1,78,972 | 38 | 21,654 | 7,26,356 |

*තාවකාලිකයි.

සංඛ්‍යා—කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

1962 දී වතුකරයේ පැවැති වැඩ වර්ජන ගණන 1961 දීට වඩා තරමක් වැඩිවිය. අනෙක් වෘත්තීන්හි පැවැති වැඩ වර්ජන ගණනෙහි එතරම් වෙනසෙක් ඇති නොවීය. තවමත් වැඩ වර්ජන බොහෝ ගණනක් ඇති වන්නේ, සේවකයන් විශාල සංඛ්‍යාවක් වෘත්තීය සමිති යටතේ සංවිධානය වී ඇති වතුකරයේය. වතු කම්කරුවනගෙන් සියයට 67·5 ක් පමණ වෘත්තීය සංගම්වල සාමාජිකයෝ වෙති. මෙය රටේ මුළු වෘත්තීය සංගම් සාමාජික සංඛ්‍යාවෙන් සියයට 58·2 ක් පමණ වෙයි. 1962 දී වතුකරයේ වැඩ වර්ජන 130ක් ද අනෙක් වෘත්තීන්හි වැඩ වර්ජන 38 ක් ද ඇති විය. 1961 දී මේ දෙ අංශයේ ඇති වූ වැඩ වර්ජන ගණන පිළිවෙළින් 90 ක් සහ 39 ක් විය. වතුකරයේ වැඩ වර්ජනයට හවුල් වූ කම්කරු සංඛ්‍යාව පසුගිය වසරට වඩා වැඩිවූ මුත් පාඩුවූ මිනිස් දවස් ගණන සමානුපාතිකව අඩු විය. අනෙකුත් වෘත්තීන් හි ද වැඩ වර්ජන වලට සහභාගීවූ ගණන වැඩි විය. එහෙත් වැඩ වර්ජන දිග්ගැස්සී ගිය නිසා පාඩුවූ මිනිස් දවස් ගණන 1961 දීට වඩා වැඩි විය. 1961 දී මිනිස් දවස් 1,70,372ක් පාඩුවූ අතර, 1962 දී පාඩුවූ ගණන 7,26,356ක් විය. පාඩුවූ මිනිස් දවස් ගණනින් 5,30,767 ක්ම පාඩු වූයේ ඩොක්, වරාය සහ වරායේ ගමනා ගමන සේවකයන්ගේ වැඩ වර්ජන නිසාය. බැංකු සේවක වැඩ වර්ජනය නිසා පාඩුවූ මිනිස් දවස් ගණන 1,65,850 ක් විය.

වැඩ වර්ජන හේතු වශයෙන් කම්කරු දෙපාර්තමේන්තුවෙන්, වර්ග කොට දක්වා ඇති කරුණු අනුව, ප්‍රධාන වශයෙන් වතුකරයේ වැඩ වර්ජන වලින් සියයට 36·9 ක්ම හටගෙන ඇත්තේ වතු නීති, විනය, වැඩ පිළියෙළ කිරීම ආදිය නිසාය. සියයට 9·2 ක් හටගෙන ඇත්තේ වැටුප් නොගෙවීම හා ගෙවීමට පමාවීම යන වැටුප් ආරාවුල් නිසාය. මුළු වැඩ වර්ජන වලින් සියයට 22·0 ක් රැකියාවෙන් නෙරපීම නිසා හෝ රැකියාවන් නැතිවී යාම නිසා ඇතිවූ අතර සියයට 0·7 ක් පඩි වැඩි කිරීම් ඉල්ලීම නිසා ඇති විය.